# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2004/49 - 2017 පෙබරවාරි මස 01 වැනි බදාදා - 2017.02.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57(1) වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව, මෙහි "අ" උපලේඛනයේ I තීරුවෙහි දක්වා ඇති නිලධර ඛණ්ඩයන් සම්බන්ධයෙන්වූ III තීරුවෙහි දක්වා ඇති බලතල, II තීරුවෙහි දක්වා ඇති රජයේ නිලධාරීන් වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙයින් පවරා දෙනු ලැබේ.

02. එසේ වුවද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරන ලද යම් බලතල පැවරීමකට අයත් විෂය පථය සම්බන්ධයෙන් හෝ එකී කොමිෂන් සභාව විසින් එලෙස සිදුකරන ලද යම් බලතල පැවරීමක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හෝ ඇතිවිය හැකි අවිනිශ්චිත තත්වයකදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුත්තේය.

03. තවද, මෙහි උපලේඛනයන්හි II තීරුවේ සඳහන් යම් රජයේ නිලධරයෙකු එකී උපලේඛනයේ I තීරුවෙහි සඳහන් අනුරූපී විෂයාංකයෙහි දැක්වෙන කිසියම් ඛණ්ඩයකට අයත් නිලධරයෙකු සම්බන්ධයෙන් පැවැත්වෙන යම් විනය පරීක්ෂණයකදී පැමිණිලිකරුවෙකු හෝ සාක්ෂිකරුවෙකු හෝ විභව්‍ය සාක්ෂිකරුවෙකු හෝ වන්නේ නම්, එම නිලධරයා සම්බන්ධයෙන් පවරනු ලැබ ඇති බලතල ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබ ඇතැයි සැලකිය යුතු වන අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභාව එකී නිලධරයා සම්බන්ධයෙන් එලෙස පවරනු ලැබ ඇති බලතල, එකී නිලධරයා සම්බන්ධයෙන් කිසිදු බලතල පැවරීමක් සිදු කර නොමැති සේ සලකා ක්‍රියාත්මක කළ යුතු වන්නේය.

04. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 57 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව බලතල පවරන ලද, අංක 1990/24 හා 2016.10.27 දිනැති *අති විශේෂ ගැසට් නිවේදනයෙහි* පළ කරනු ලැබ ඇති "අ" උපලේඛනයෙහි බලතල පැවරීමට අදාළ සෞඛ්‍ය විෂය සම්බන්ධ විධිවිධාන, පූර්වෝක්ත *ගැසට් පත්‍රයෙහි* පළ කරන ලද බලතල පැවරීම යටතේ ගන්නා ලද හෝ ගනු ලබනු ඇතැයි සැලකෙන යම් ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබේ.

**"අ" උපලේඛනය**

| *I තීරුව*<br>*නිලධාරී ගණය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 1. පහත දැක්වෙන දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් I වන ශ්‍රේණියට අයත් හා ඊට ඉහළ නිලධරයන් | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් | I. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය. |

"අ" උපලේඛනය (සම්බන්ධිතයි)

| I තීරුව<br>නිලධාරී ගණය | II තීරුව<br>බලතල පවරනු ලබන<br>රාජ්‍ය නිලධරයන් | III තීරුව<br>පවරන ලද බලතල |
|---|---|---|
| - ශ්‍රී ලංකා වෛද්‍ය සේවය<br>- ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | | II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 3/2016 ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම |
| 2. පහත දැක්වෙන දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් I වන ශ්‍රේණියට පහළ නිලධරයන්<br>- ශ්‍රී ලංකා වෛද්‍ය සේවය<br>- ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 3/2016 ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම |
| | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් /අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයකු | II. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය. |
| 3. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ I වන ශ්‍රේණියේ හා ඊට ඉහළ නිලධරයන් | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් | I. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය.<br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 3/2016 ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම |
| 4. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ I වන ශ්‍රේණියට පහළ නිලධරයන් | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 3/2016 ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම |
| | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් /අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයකු | I. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය. |
| 5. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති තෘතීයික මට්ටමේ අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 3/2016 ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම |
| | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් /අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයකු | I. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය. |
| 6. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන ඒකාබද්ධ සේවයට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ද්විතීයික හා තෘතීයික මට්ටමේ නිලධරයන්<br>(ආයුර්වේද දෙපාර්තමේන්තුව හැර) | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව/ බඳවා ගැනීමේ පරිපාටිය අනුව පත්කිරීම හා උසස් කිරීම<br>II. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම. |

"අ" උපලේඛනය (සම්බන්ධිතයි)

| I තීරුව<br>නිලධාරී ගණය | II තීරුව<br>බලතල පවරනු ලබන<br>රාජ්‍ය නිලධරයන් | III තීරුව<br>පවරන ලද බලතල |
|---|---|---|
| | | III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 3/2016 ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම |
| | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශ ලේකම් /අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයකු | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම ඇතුළු සියලුම ස්ථාන මාරු කිරීම<br>II. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය |
| 7. ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතට ගැනෙන ඒකාබද්ධ සේවයට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ද්විතීයික හා තෘතීයික මට්ටමේ නිලධරයන් | ආයුර්වේද කොමසාරිස් ජනරාල් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව/ බඳවා ගැනීමේ පරිපාටිය අනුව පත්කිරීම හා උසස් කිරීම<br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම ඇතුළු සියලුම ස්ථාන මාරු කිරීම.<br>III. විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම<br>IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 3/2016 ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම |
| 8. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට ගැනෙන ඒකාබද්ධ සේවයට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ නිලධරයන් (ආයුර්වේද දෙපාර්තමේන්තුව හැර) | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව/ බඳවා ගැනීමේ පරිපාටිය අනුව පත්කිරීම හා උසස් කිරීම<br>II. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම.<br>III. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 3/2016 ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම |
| | සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම් /අමාත්‍යාංශ ලේකම් විසින් නම් කරනු ලැබ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන අතිරේක ලේකම්වරයකු | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම ඇතුළු සියලුම ස්ථාන මාරු කිරීම<br>II. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ දෙවන උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය |

"අ" උපලේඛනය *(සම්බන්ධිතයි)*

| *I තීරුව*<br>*නිලධාරී ගණය* | *II තීරුව*<br>*බලතල පවරනු ලබන රාජ්‍ය නිලධරයන්* | *III තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|---|
| 9. ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතට ගැනෙන ඒකාබද්ධ සේවයට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ නිලධරයන් | ආයුර්වේද කොමසාරිස් ජනරාල් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව/ බඳවා ගැනීමේ පරිපාටිය අනුව පත්කිරීම හා උසස් කිරීම<br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම ඇතුළු සියලුම ස්ථාන මාරු කිරීම<br>III. විනය පාලනය සහ සේවයෙන් පහ කිරීම<br>IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 3/2016 ප්‍රකාරව කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම |

02 - 675/1

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් බලතල පැවරීම.

01. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 (1) වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව, මෙහි "ආ" උපලේඛනයේ, I තීරුවෙහි දක්වා ඇති නිලධර ඛණ්ඩයන් සම්බන්ධයෙන්වූ II තීරුවෙහි දක්වා ඇති බලතල, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සෞඛ්‍ය සේවා කමිටුව වෙත රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් මෙයින් පවරා දෙනු ලැබේ.

02. එසේ වුවද, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් සිදුකරන ලද යම් බලතල පැවරීමකට අයත් විෂය පථය සම්බන්ධයෙන් හෝ එකී කොමිෂන් සභාව විසින් එලෙස සිදුකරන ලද යම් බලතල පැවරීමක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් හෝ ඇතිවිය හැකි අවිනිශ්චිත තත්වයකදී රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක හා තීරණාත්මක විය යුත්තේය.

03. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 56 (1) වන ව්‍යවස්ථාව ප්‍රකාරව බලතල පවරන ලද, අංක 1990/24 හා 2016.10.27 දිනැති *අති විශෙෂ ගැසට් නිවේදනයෙහි* පළ කරනු ලැබ ඇති "ආ" උපලේඛනයෙහි බලතල පැවරීමට අදාළ සෞඛ්‍ය විෂය සම්බන්ධ විධිවිධාන, පූර්වෝක්ත ගැසට් පත්‍රයෙහි පළ කරන ලද බලතල පැවරීම යටතේ ගන්න ලද හෝ ගනු ලබනු ඇතැයි සැලකෙන යම් ක්‍රියාමාර්ගයකට අගතියක් නොවන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබේ.

"ආ"උපලේඛනය

| *I තීරුව*<br>*නිලධාරී ගණය* | *II තීරුව*<br>*පවරන ලද බලතල* |
|---|---|
| 1. පහත දැක්වෙන දීප ව්‍යාප්ත සේවාවන්ට අයත් නිලධරයන්<br>- ශ්‍රී ලංකා වෛද්‍ය සේවය<br>- ශ්‍රී ලංකා ආයුර්වේද වෛද්‍ය සේවය | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව අනුව පත්කිරීම හා උසස් කිරීම<br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම ඇතුළු සියලුම ස්ථාන මාරු කිරීම<br>III. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම<br>IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 3/2016 මගින් අමාත්‍යාංශ ලේකම්වරයාට ලබාදී ඇති බලතලවලට අමතරව වන්නාවූ කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම |

"අ" උපලේඛනය (සම්බන්ධිතයි)

| I තීරුව<br>නිලධාරී ගණය | II තීරුව<br>පවරන ලද බලතල |
|---|---|
| 2. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට හා ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, දීප ව්‍යාප්ත සේවාවකට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධරයන් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව අනුව/ බඳවා ගැනීමේ පරිපාටිය අනුව පත්කිරීම හා උසස් කිරීම<br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම ඇතුළු සියලුම ස්ථාන මාරු කිරීම<br>III. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම<br>IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 3/2016 මගින් අමාත්‍යාංශ ලේකම්වරයාට ලබාදී ඇති බලතලවලට අමතරව වන්නාවූ කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම |
| 3. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට හා ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති තෘතීයික මට්ටමේ අධි ශ්‍රේණියේ/ විශේෂ ශ්‍රේණියේ නිලධරයන් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ සේවා ව්‍යවස්ථාව/ බඳවා ගැනීමේ පරිපාටිය අනුව පත්කිරීම හා උසස් කිරීම<br>II. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලැබූ පරිපාටිය අනුව වාර්ෂික ස්ථාන මාරු කිරීම ඇතුළු සියලුම ස්ථාන මාරු කිරීම<br>III. ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ පළමු උපලේඛනයේ දක්වා ඇති වැරදි සම්බන්ධයෙන් වූ විනය පාලනය හා සේවයෙන් පහ කිරීම<br>IV. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 3/2016 මගින් අමාත්‍යාංශ ලේකම්වරයාට ලබාදී ඇති බලතලවලට අමතරව වන්නාවූ කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම |
| 4. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට හා ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, ඒකාබද්ධ සේවයට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ද්විතීයික හා තෘතියික මට්ටමේ නිලධරයන් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 3/2016 මගින් අමාත්‍යාංශ ලේකම්වරයාට ලබාදී ඇති බලතලවලට අමතරව වන්නාවූ කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම |
| 5. සෞඛ්‍ය විෂය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය යටතට හා ආයුර්වේද දෙපාර්තමේන්තුව යටතට ගැනෙන, ඒකාබද්ධ සේවයට අයත් නොවන අංක 06/2006 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ (II ඇමුණුම) හි අර්ථ නිරූපණය කර ඇති ප්‍රාථමික මට්ටමේ නිලධරයන් | I. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 3/2016 මගින් අමාත්‍යාංශ ලේකම්වරයාට ලබාදී ඇති බලතලවලට අමතරව වන්නාවූ කාර්යක්ෂමතා කඩඉම් විභාග සම්බන්ධයෙන් සහන ලබාදීම |

01. මෙම බලතල පැවරීම මෙහි අඩංගු වී ඇති අයුරින් දෙදහස් දහහතේ (2017) පෙබරවාරි මස 01 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක විය යුතු වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

එච්. එම්. ගාමිණී සෙනෙවිරත්න,
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2017 ජනවාරි මස 31 වන දින,
177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ 05, රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

02 - 675/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.